Embassy of the United States of America
Colombo

# PRESS RELEASE

Public Affairs Section
Tel:  +94 (11) 249-8100 ● Fax:  +94 (11) 244-9070
Email: shenjy@state.gov ● http://srilanka.usembassy.gov

Release No. 20160520-2

**ගංවතුරෙන් පීඩා විඳින ජනතාවගේ සහාය සඳහා එක්සත් ජනපදය විසින් තුන් අවුරුදු සැලැස්මක්**

මැයි 20, 2016: වර්තමානයේ බටහිර ශ්‍රී ලංකාවේ වර්ධනය වී ඇති බරපතල ගංවතුර තත්ත්වය සැලකිල්ලට ගෙන, ආහාර-නොවන හදිසි ආපදා සහන ලෙස මෙට්ට, ඇතිරිලි, ඇඳුම් සහ සනීපාරක්ෂක කට්ටල ලබාදීම සඳහා එක්සත් ජනපද රජය විසින් රුපියල් මිලියන 7.2 (ඇමෙරිකානු ඩොලර් 50,000) ක් ප්‍රධානය කර ඇත.

මීට අමතරව, කොළඹ එක්සත් ජනපද තානාපති කාර්යාලය විසින් ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනයේ (USAID) විදේශ ආපදා ආධාර පිලිබඳ කාර්යාලය සමඟ එක්ව, ගංවතුර සහ නියං තත්ත්ව වලින් පීඩා විඳින ජනතාව සඳහා රුපියල් මිලියන 144ක (ඇමෙරිකානු ඩොලර් මිලියනයක්) වියදමින් ආරක්ෂිත, ආපදා වලට ඔරොත්තු දිය හැකි, තුන් අවුරුදු පානීය ජල ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට කඩිනම් සැලසුම් සකසමින් සිටියි.  මෙම නව වැඩසටහන තුළින් හදිසි ආපදා සඳහා ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නංවන අතර ස්වභාවික ආපදා තත්ත්වයන් වලදී පානීය ජලය විශ්වාසනීය ලෙස ලබාගැනීමේදී ඇතිවන ගැටළුවලට විසඳුම් ලැබෙනු ඇත. "එක්සත් ජනපදය මෙම ප්‍රතිචාරය දක්වන්නේ ඇමෙරිකානු සහ ශ්‍රී ලාංකික ජනතාව අතර පවතින දීර්ඝ කාලීන මිත්‍රත්වය සහ දෙරට රජයන් අතර වැඩි දියුණු වන සහයෝගිතාවය පදනම් කරගෙන," යැයි එක්සත් ජනපද තානාපති අතුල් කෙශප් පවසා සිටියි.

තානාපති කාර්යාලය විසින් දැනට පවතින හදිසි ආපදා තත්ත්වය අධීක්ෂණය කරමින් සිටින අතර ඉදිරියේදී වැඩිදුරටත් ඇතිවිය හැකි අවශ්‍යතා කඩිනමින් හඳුනා ගැනීමට ශ්‍රී ලංකා රජය සමඟ සමීපව කටයුතු කරමින් සිටියි.

###